
# අපූර්ව අහස



නිෂිනි රදීමහලියද්ද

# ඇපුරු අහස

නිෂිනි රිදීමහලියද්ද

අපුරු අහස

©නිෂිනි රිදීමහලියද්ද
මහාමායා බාලිකා විදුහල
1 ශ්‍රේණිය
2025.02.08
ISBN 978-624-208-424-4

# පිදුම

*මා සෙනෙහසින් හැදූ වැඩූ මාගේ ආදරණීය*

*අම්මාටත්, අප්පච්චිටත්*

*ආදරයෙන් පුදමි.*

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියත් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමු කරන "හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය  මහනුවර.


මම අද උදෙන්ම නැගිටලා අහස දිහා බැලුවා. ඉර හෙමින්  හෙමින් කන්ද උඩින් පායනවා. හරිම ලස්සනයි. කුරුල්ලො ඈත අහසේ රංචු පිටින් පියාඹනවා. අම්මා කියුවේ කුරුල්ලෝ කෑම හොයාගෙන ගනවලු.



දැන්නම් අහස නිල්ම නිල් පාටයි. අහස දිහා බලන්න බෑ ඇස් දෙක රිදෙනවා .



එක පාරටම අහසෙන් අමුතු සද්දයක් ඇහෙනවා මට බය හිතුණා. මම ඉක්මන්ට අක්කාට කතා කළා. ''අක්කා අක්කා අහසෙන් අමුතු සද්දයක් ඇහෙනවා. '' නංගි ඒ ප්ලේන් එකක් යනවා. අර බලන්න අහස දිහා'' ඈත අහසේ ප්ලේන් එකක් යනවා හරිම පුංචියි. හරියට සෙල්ලම් බඩුවක් වගේ.



එක පාරටම නිල් පාටට තිබුණු වළාකුළු කලු පාට වුණා. මට ඇහුණා අම්මා කියනවා   වැස්සක් වහින්න යන්නේ කියලා. අහස හොදටම ගොරවනවා, අකුණු ගහනවා හොදටම වහිනවා. හරියට අහසට තරහා ගහින් වගේ.



ටික ටික වැස්ස අඩු වුණා. කළු වලාකුළු ඈතට පාවෙවී යනවා. ඈත අහසේ දේදුන්නක් පායලා හරිම ලස්සනයි. දේදුන්නේ පාට ගොඩයි. හරිම ලොකු දේදුන්නක්.ටික වෙලාමවක් යද්දි දේදුන්නත් යන්න ගියා.



හවස් වෙද්දි ඉර බහිනවා බලන්න මම හරිම ආසයි. ටික ටික පරිසරය අඳුරු වෙනවා. අහසත් තද නිල් පාට වෙලා කුරුල්ලෝ රංචු පිටින් පියඹනවා



දැන් නම් රෑ වෙලා. රෑ අහස හරිම ලස්සනයි අහස කළු පාටයි. හඳ පයලා තියනවා හරිම ලස්සනට අත්තාම්මා කිවේ පෝය ලඟ නිසා හඳ එලිය හොදට තියනවා කියලා. හඳ වටේට ගොඩක් තරු තියනවා. හරියට පුංචි පුංචි මල් පිපිලා වගේ.



අක්කායි මමයි මිදුලේ වාඩි වෙලා අහස දිහා බලා ගෙන හිටියා. අක්කා කියනවා  අහසේ  තරු රටා ගොඩක්  තියනවා. ඒ වගේම තරු වගේ පේන ග්‍රහ ලෝකත් තියෙන්වලු.



නංගි  අර බලන්න තරුවක් කඩාගන වැටෙනවා හරිම ලස්සනයි. අහස වෙනස් වෙන විදිහ හරිම අපුරුයි. අක්කා මට අහස ගැන තව ගොඩක් දේවල්  කියලා දුන්නා. දන්නේම නැතුවම ගොඩක් රෑ වෙලා අම්මා කතා කළ නිසා අපි ගේ ඇතුලට ගියා.



කන්ද උඩින් ඉර මාමා එබී බලනවා.
පුළුවන් වළා අහස පුරා පාවී යනවා.
තරු දහසක් හඳ වටකර හැඩට දිළෙනවා.
මුළු අහසම හරිම හැඩට අපට පෙනෙනවා.



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණ කරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටත් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය.

මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දූරස්විම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්